**ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය - 2019**

**------------------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**----------------------------**

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

**------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදි.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

---------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

-----------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් අධිකාරිය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

-----------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 07 ට පටහැනිව, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා ඒම් ලෙස දැක්විය යුතු, වර්ෂය තුල ලද පොලී ආදායම රු.159,732,734 ක් හා ලද ලාභාංශ රු.130,697 ක් වෙනුවට වර්ෂයට අදාල පොලී ආදායම වූ රු.160,360,015 ක් හා ලාභාංශ ආදායම රු.689,697 ක් දක්වා තිබුණි. | විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය තුල දක්වා ඇති පොලී ආදායම් රු.160,360,015 පොලී ආදායම් ලැබීම් ලෙසත්, ලාභාංශ ආදායම් රු.689,697 ලාභාංශ ආදායම් ලෙසත් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා ඇත. ඒ අනුව මුදලින් ලද පොලී ප්‍රමාණය හා ලාභාංශ ප්‍රමාණය පමණක් දැක්වීමට කටයුතු කරනු ඇත. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය සැකසීමේදී ප්‍රමිතයේ නියමයන්ට අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | අධිකාරිය විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කර නොතිබුණි. පිරිවැය රු.108,582,091 ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද මෝටර් | ප්‍රමිත අංක 16 හි 29 වන වගන්තිය ප්‍රකාරව වත්කම් පිරිවැයට ගිණුම්ගත කිරීම ආයතනයේ ප්‍රතිපත්තියයි. නමුත්, 2017 විගණනයේදී පෙන්වා දුන් පරිදි වාහන | ප්‍රමිතයේ නියමයන්ට අනුව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| වාහන 26 ක් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. මේ අනුව ගිණුම්කරණ ඇස්තමේන්තුවල පවතින දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 අනුව ප්‍රතිශෝධනය කර සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | වත්කම් ප්‍රභේදය ප්‍රත්‍යාගණනය 2017 දී ආරම්භ කර ඇතත් 2019 වර්ෂය අවසානය වන විට එක වාහනයක තක්සේරු වටිනාකම තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලැබී නොතිබුණි. මේ පිළිබඳව ගිණුම් උපලේඛන (3) හි හෙළිදරව් කර ඇත. 2020 වර්ෂය ඉකුත්වීමට ප්‍රථම සියළුම වාහන නැවත ප්‍රත්‍යාගණනය කරනු ඇත. | |

## 1.5.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරියේ ගිණුම් ප්‍රතිපත්තිය අනුව සෑම වර්ෂයකදීම දේපල පිරියත හා උපකරණ හා අස්පෘශ්‍ය වත්කම්වල ඉදිරියට ගෙන යා යුතු වටිනාකම සමාලෝචනය කර ගිණුම්වලට ගැලපිය යුතු වුවත් එසේ සමාලෝචනය කිරීමකින් තොරවදේපල පිරියත හා උපකරණ, ලැබිය යුතු ශේෂ, තැන්පතු හා අත්තිකාරම් සහ වෙනත් වත්කම් සඳහා එකතුව රු.5,976,657 ක් හානිකරන අලාභ සඳහා ගැලපීම් කර තිබුණි. | දේපළ, පිරියත හා උපකරණ අස්පෘශ්‍ය වත්කම්වල හානිකරණ අලාභ සම්බන්ධයෙන් තොරතුරු 2019 වර්ෂයේදී වාර්තා වී නොමැති බැවින් ඉදිරියට ගෙන ආ ශේෂයන් ගිණුම්වල පෙන්වා ඇත. | ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුව කටයුතු කළ යුතුය. |

## 1.5.4 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මැණික් ඉඩම් වෙන්දේසිවලදී ඉඩම් හිමිකාර පාර්.ශවය වෙත ගෙවිය යුතු ලාභයෙන් සියයට 40 ක කොටස ගෙවීම සම්බන්ධව ඉඩම් හිමිකාර පාර්.ශව අතර පවතින නඩුවක් හේතුවෙන් අදාල ලාභ කොටස් අමාත්‍ය මණ්ඩල අනුමැතියක් මත අධිකාරිය විසින් 2016 සහ 2017 වර්ෂවලදී රු.120,713,647ක් මහා භාණ්ඩාගාරයේ තාවකාලික අතිරික්ත භාර අරමුදල් ගිණුමේ තැන්පත් කර තිබුණි. මෙම | 2016 හා 2017 වර්ෂවල සිදුකල බගවන්තලාව මැණික් ඉඩම් වෙන්දේසි ආදායමින් මහා භාණ්ඩාගාරය වෙත මුදල් නිදහස් කර ඇත. එම මුදල් ඒකාබද්ධ අරමුදල වෙත ගෙවා ඇත්තේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් දුන් ලිඛිත උපදෙස්වලට අනුකූලවය. විගණනයේ | නිවැරදි ලෙස ගිණුම්වල දැක්වීමට කටයුතු කල යුතුයි. |

| | | | |
|---|---|---|---|
| | මුදල තැන්පතුවක් ලෙස පෙන්වීම වෙනුවට අදාල වර්.ෂවල වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. තවද අරමුදලේ කලමනාකරු විසින් අධ්‍යක්ෂ (මුල්‍ය ) වෙත 2020 ජුනි 22 දිනැති ලිපියෙන් දැනුම් දී ඇත. | පෙන්වා ඇති පරිදි ඉදිරියේදී තැන්පතුවක් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ. | |
| (ආ) | අධිකාරියේ වාහන 25 ක් 2017 හා 2018 වර්ෂවල ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කර තිබුණද එක් වාහනයක් ප්‍රත්‍යාගණනය නොකිරීම හේතුවෙන් කාර්ය සම්පූර්ණ කර වටිනාකම් ගිණුම්ගත කිරීමට සමාලෝචිත වර්ෂයේදී ද පියවර ගෙන නොතිබුණි. | 2017 මැයි 15 දින අධිකාරිය සතු රථවාහන 27 ක් තක්සේරු කිරීම තක්සේරු දෙපාර්තමේන්තුව වෙත පවරා ඇත. ඒ අනුව වාහන 26 ක් තක්සේරුකර වාර්තා ඉදිරිපත් කර ඇති අතර එක වාහනයක් සඳහා තක්සේරු වාර්තා මේ දක්වා ලබාදී නොමැත. ඉදිරියේදී පුද්ගලික අංශයෙන් මිල ගණන් කැඳවා වාහන තක්සේරු වාර්තා ලබාගැනීමට හැකියාව ඇත. | තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු කර ප්‍රත්‍යාගණනය වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුයි. |

**1.5.5 අධිකාරි බලය නොලත් ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරිය විසින් ලෝක වෙළඳ මධ්‍යස්ථානයෙන් කුලියට ගෙන සුළු හා මධ්‍ය පරිමාණ වෙළඳුන් වෙත කුලී පදනම මත ලබාදී තිබූ වෙළඳ කුටි සඳහා ලැබිය යුතු කුලී ආදායමෙන් සමාලෝචිත වර්ෂයේ හිඟව තිබූ රු.4,476,521 ක් අයකර ගත නොහැකි ශේෂයක් ලෙස සලකා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව කපාහැර තිබුණි. | අධිකාරිය වෙත ලැබිය යුතු නමුත් 2019 දෙසැම්බර් 31 දිනට නොලැබීමේ ඉහල සම්භාවිතාවයන් සහිත ශේෂ අයකර ගැනීම සඳහා මේ වන විටත් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා යොමු වී ඇත. එමෙන්ම තැන්පත් මුදල් ඉක්මවා ඇති ලැබිය යුතු ශේෂයන් සඳහා බොල්ණය වෙන්කිරීම සිදුකොට ඇත. | අදාල අනුමැතීන් ලබා ගැනීමට සහ ලැබිය යුතු ආදායම අය කර ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අධිකාරිය විසින් පනතින් පැවරී ඇති බලතල ප්‍රකාරව මැණික් ඉඩම්, මැණික් ගල් හා ඉල්ලම් වෙන්දේසි කිරීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු නොකරන අතර ඒ සඳහා වෙනත් මාර්ගෝපදේශයක් සකස් කර ඊට මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | මැණික් ඉඩම් වෙන්දේසිවලදී රජය සතු මැණික් ගැරීමේ අයිතිය දෙවන පාර්ශවයක් සඳහා සීමිත කාලයකට බැහැර කිරිම සිදුකරයි. සංවර්ධන ව්‍යාපෘති වලදී හමුවන මැණික් ඉල්ලම් එම සංවර්ධන කටයුතු වලටද බාධා නොවන පරිදි රජයට උපරිම ආදායමක් ලැබෙන පරිදි විශේෂ ක්‍රමවේදයන් භාවිතා කරමින් වෙන්දේසි කරයි. මෙම කර්මාන්තයේ සුවිශේෂිභාවය සලකා සුවිශේෂි වූ මාර්ගෝපදේශන සකස් කර වෙන්දේසි සිදුකරයි. | මාර්ගෝපදේශ වලට අදාල අනුමැතීන් ලබා ගැනීමට කටයුතු කල යුතුය. |

**1.5.6 ලැබිය යුතු මුදල්**

-----------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | යාන්ත්‍රික මැණික් පතල් කැණීම් බලපත්‍ර වාර්ෂිකව දීර්ඝ කිරීමේදී කැණීම්කරුවන් දෙදෙනෙකුගෙන් අයකල යුතු සේවා ගාස්තු එකතුව රු.195,000 ක් හා පතල්කරුවන් 14 ක ගෙන් අයකල යුතු මාසික පතල් අධීක්ෂණ ගාස්තු එකතුව රු.1,600,000 ක් අයකරගෙන නොතිබුණි. | යාන්ත්‍රික පතල් සඳහා කොළඹ සහ මොණරාගල ප්‍රාදේශීය කාර්යාල විසින් අඩුවෙන් අයකල මුදල් නැවත අයකර ගැනීමට කටයුතු කර ඇත. රත්නපුර සහ ඇහැලියගොඩ ප්‍රදේශ වල මැයි, ජුනි මාසවල ගංවතුර සහ අධික වර්ෂාපතනය හේතුවෙන් පතල් කැපුම් සිදු නොකිරීම, ඇතැම් පතල් තාවකාලිකව කැපුම් නතර කිරීම, යාන්ත්‍රික පතල් අවසරය අවසන් වූ පසු නැවත අලුත්කර ගැනීමට කලක් ගත වීම යන හේතුමත එම කාලයට මාසික පතල් ගාස්තු ගාස්තු අය නොවී ඇත. | අදාල ගාස්තු අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | 2018 වර්ෂයේ පවත්වා තිබූ ප්‍රදර්ශනයකට අදාල රු.500,000 ක වියදමක් තවදුරටත් තැන්පතුවක් ලෙස ගිණුම්වල දක්වා තිබුණි. | 2018 වර්ෂයේ Facet Sri Lanka ප්‍රදර්ශනය සඳහා බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවට මෙම ගෙවීම සිදුකර ඇති අතර ප්‍රදර්ශනයේ සමස්ථ පිරිවැය තබන ලද තැන්පතු මුදලද ඉක්මවා තිබීම හේතුවෙන් මෙම රු.500,000 මුදල ලබාගත නොහැක. | නිවැරදි ලෙස ගිණුම්වල දැක්වීමට කටයුතු කල යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනතේ 15(2) වගන්තිය | මැණික් පරීක්ෂා කිරීම හා සහතික නිකුත් කිරීම සඳහා පවත්වාගෙන යන පෞද්ගලික රසායනාගාර ලියාපදිංචි කිරීමට හා නියාමනය කිරීමට ක්‍රමවේද සකස් කර නොතිබුණි. | අංක NGJA/පොදු ලිපි සහ 2019 මාර්තු 19 දිනැති ලිපිය මගින් අවශ්‍ය නීති උපදෙස් ලබාදෙන ලදී. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 13(8) වගන්තිය | මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර ඉකුත් වර්ෂයේ විගණකාධිපති වාර්තාවට පිළිතුරු ලබාදී නොතිබුණි. | වාර්තාව සම්බන්ධයෙන් විගණන කළමනාකරණ කමිටුව සාකච්ඡා කර අධ්‍යක්ෂ මණ්ඩල තීරණද සමග පිළිතුරු සමාලෝචනය කර ඇත. | මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | (i) මුදල් රෙගුලාසි 142(2) | 2018 හා 2019 පෙබරවාරි දක්වා කාලය තුල රන් ප්‍රමාණය නිශ්චය කිරීමේ අංශය විසින් රු.1,508,707 ක් වූ සේවා ගාස්තු උපලබ්ධි වීමට පෙර සේවා සපයා තිබුණි. | මේ වන විට එම මුදල් සම්පූර්ණයෙන්ම අය කර ගෙන ඇත. ඉන්පසු සේවා ගාස්තු අය කර ගැනීමෙන් පසුව පමණක් සේවා සැපයීම සිදු කරයි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| | (ii) මුදල් රෙගුලාසි 396 | වර්ෂ 10 කට පෙර ලැබී අගරු වී තිබූ රු.178,000 ක් වූ චෙක්පත් 02 ක් සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | චෙක්පත් අගරුවීම් සම්බන්ධව ජා.ක්‍රි.හා ප්‍රා. සංවර්ධන (කොළඹ) හා අපනයන ප්‍රවර්ධන අංශය විසින් ක්‍රියාමාර්ග ගෙන තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2015 ජූලි 14 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 03/2015 මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 371 | නිලධාරියෙකුට අවස්ථා 11 කදී රු.100,000 ඉක්මවා අත්තිකාරම් ලබාදීම, අවස්ථා 15 කදී ලබාදී තිබූ රු.280,000 ක අත්තිකාරම් දින 15 සිට දින 40 දක්වා ප්‍රමාද වී පියවා තිබීම,අවශ්‍යතාව සලකා බැලීමකින් තොරව අත්තිකාරම් ලබාදීම නිසා අවස්ථා 11 කදී ලබාදී තිබූ රු.101,900 ක මුළු අත්තිකාරම් මුදල හා අවස්ථා 28 කදී ලබාදී තිබූ රු.435,700 ක මුළු අත්තිකාරම් මුදලින් සියයට 50 කට වඩා ආපසු පියවා තිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික ගණන 11 ක් වන නිසා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා ලබා ගත යුතු අත්තිකාරම් මුදල රු.100,000 ක සීමාව ඉක්මවීම වැලැක්විය නොහැක. භාණ්ඩ හා සේවා ලබාගැනීමේදී මතු වූ ගැටළු මත දින 03 ක කාලය ඇතුලත මෙම අත්තිකාරම් පියවී නොමැත. ලබාදෙන අත්තිකාරම් කඩිනමින් පියවීමට කටයුතු කරන ලෙස දැනුවත් කොට ඇත. මුළු අත්තිකාරම් මුදල නැවත පියවීමට හේතු දක්වන ලෙස දන්වා එම අංශ වෙත ලිපි යවා ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඉ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ 13.4 වගන්තිය | තනතුරට අදාල සුදුසුකම් සපුරා නොතිබූ නිලධාරියෙකු අධ්‍යක්ෂ ජනරාල් තනතුරේ වැඩ බැලීම සඳහා පත්කර තිබුණි. | 1993 අංක 50 දරන ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරි පනතේ 23 වන වගන්තිය යටතේ විෂයභාර අමාත්‍යවරයාගේ ලිඛිත නියෝගයට අදාල අධ්‍යක්ෂ මණ්ඩලීය අනුමැතිය මත අධ්‍යක්ෂ ජනරාල් තනතුරේ වැඩ බැලීම සඳහා එකී නිලධාරියා පත් කර ඇත. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඊ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ඡේදය | 2017 සහ 2018 වර්ෂවල වාර්ෂික වාර්තා විගණන දිනය වූ 2019 මැයි 15 වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | 2017 සහ 2018 වර්ෂයන්ට අදාල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා රේඛීය අමාත්‍යංශය වෙත යොමුකර ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | 2013 නොවැම්බර් 01 දිනැති අංක Dms/Policy/03 දරන කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය | තනතුරු 32 ක් සඳහා නව බඳවා ගැනීමේ පරිපාටි සංශෝධනය කර අනුමත කරගෙන නොතිබුණි. | අධිකාරිය සඳහා අනුමත සියලුම තනතුරුවලට අදාල බඳවා ගැනීමේ පරිපාටීන් කෙටුම්පත් කර 2020 මාර්තු 04 දින කලමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලදී. | උපදෙස් ප්‍රකාරව කටයුතු කල යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.162,435,579 ක ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ලාභය රු.121,557,720 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.40,877,859 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පරීක්ෂණ සඳහා අයකිරීම් රු.22,171,192 කින්, පොලී ආදායම රු.32,015,292 කින්, බැංකෝ සේවා සඳහා අයකිරීම් රු.12,228,750 කින් හා මැණික් ගැරීම් ආදායම රු.5,578,800 කින් වැඩිවීමත්, විදේශ ප්‍රදර්ශන වියදම රු.9,903,197 කින් අඩුවීමත් ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරිය විසින් වෙන්දේසි කරන ලද බගවන්තලාව වැපල්ටන්වත්ත මැණික් ඉඩමේ කැබලි 14 ක පැවති පතල්වලවල් මැණික් ඉඩම්ලාභීන් විසින් වසා දමා නොතිබූ අතර ඊට අදාලව ඉඩම්ලාභීන්ගෙන් ලබාගත් ඇප මුදල් රාජසන්තක කිරීමට කටයුතු කර නොතිබුණි. | පතල් වළවල් තුළ තවදුරටත් මැණික් ඉල්ලම් පවතින බැවින් හා එම ව්‍යාපෘතිය ඉදිරියටත් කරගෙන යැමට සැලසුම් කරගෙන තිබූ හෙයින් එම වළවල් නොවසා තබන ලදී. නමුත් අදාළ වතු සමාගම ඉඩම් කොටස් නිදහස් කිරීම ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් පතල් වළවල් වසා දැමීමට අවශ්‍ය මූලික කටයුතු සම්පාදනය සිදුකොට ඇත. | පතල් වලවල් වසා දැමීමට කටයුතු කල යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකාවට රත්‍රන් ආනයනය කිරීම සම්බන්ධව ප්‍රමාණවත් නියාමනයක් හෝ පහසුකම් සැලැස්වීමක් අධිකාරිය විසින් සිදුකර නොතිබුණි. | 1993 අංක 50 දරන ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනතේ රත්‍රන් ආනයනය කිරීම පිළිබඳ | රත්‍රන් ආනයනය නියාමනයට සහ පහසුකම් සැලැස්වීමට පියවර |

| | | | |
|---|---|---|---|
| | | ප්‍රතිපාදන නොමැත. ස්වර්ණාභරණ කර්මාන්තකරුවන්ට පහසුකම් සැලසීම සඳහා සහනදායී බද්දකට යටත්ව රත්‍රන් ආනයනය කිරීම සඳහා පහසුකම් සැලසීමට 2018 වර්ෂයේදී පනවන ලද 15% ක රේගු බද්ද සම්බන්ධව අධිකාරියේ මැදිහත්වීමෙන් සහ අධීක්ෂණයෙන් මහ බැංකුව සහ භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කරන ලදි. | ගත යුතුය. |
| (ඇ) | 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ පනත 1993 වර්ෂයේ අනුමත කර ගැනීමෙන් පසුව එය කාලානුරූපීව සංශෝධනය කර ගැනීමට සමාලෝචිත වර්ෂයේද පියවර ගෙන නොතිබුණි. | 1993 අංක 50 දරන ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරී පනත සංශෝධනය කිරීම සම්බන්ධයෙන් 2019 සැප්තැම්බර් 24 දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාල තීරණය ප්‍රකාර නව කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනිමට පියවර ගත යුතු ව ඇත. අමාත්‍ය මණ්ඩල තීරණය සම්බන්ධයෙන් අධිකාරියේ ඉහළ කළමනාකාරීත්වයේ නිරීක්ෂණ මේ දක්වා ලබා ගැනීමට නොහැකි විය. ඒ සඳහා ඉදිරියේදී අවශ්‍ය පියවර ගන්නා බව කාරුණිකව දන්වා සිටිමි. | අධිකාරිය පනත කාලානුරූපීව සංශෝධනය කිරීමට පියවර ගත යුතුය. |
| (ඈ) | අධිකාරියේ නීති අංශයේ නීතිඥයින් 5 ක් සේවය කරමින් සිටින අතර විවිධ පාර්ශව විසින් අධිකාරියට විරුද්ධ පවරා තිබූ නඩු 30 කින් 26 ක් සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ සේවය ලබාගැනීම වෙනුවෙන් රු.859,114 ක් ගෙවා තිබුණි. | අධිකාරියේ නීති අංශයේ නිලධාරීන් රාජකාරී අවශ්‍යතාවය මත රත්නපුර ප්‍රාදේශීය කාර්යාලයට සහ ප්‍රධාන කාර්යාලයට අනුයුක්ත කර ඇත. මැණික් ගැරීම් බලපත්‍ර වැටලීම් සම්බන්ධ නෛතික කටයුතු සහ අනෙකුත් නෛතික කටයුතු බහුල බැවින් නීතිපති දෙපාර්තමේන්තුවේ සහය ලබා ගැනීමට කටයුතු කර ඇත. | නෛතික කටයුතු සඳහා අධිකාරියේ නීති නිලධාරීන්ගේ සහාය ලබා ගැනීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| (ඉ) මැණික් ගැරීම් බලපත්‍ර කොන්දේසි කඩ කිරීම වෙනුවෙන් චක්‍රලේඛ ප්‍රකාර තීරණය කර තිබූ සමථ ගාස්තුව අවස්ථා 6 කදී රු.647,500 ක් අඩුවෙන් අයකර තිබුණි. එහිදී අධිකාරිය පැවැත්වූ රජත ජයන්ති උළෙල සඳහා නිත්‍යානුකූල නොවන ආකාරයට අනුග්‍රාහකත්වයක් ලබා ගැනීම හේතුවෙන් එක් බලපත්‍රලාභියෙකුගෙන් සමථ ගාස්තුවෙන් සියයට 25 ක් පමණක් අය කිරීමට සභාපතිවරයා නියෝග කර තිබූ අතර ඒ මත අයකර නොගත් සමථ මුදල රු.250,000 ක් විය. | 1993 අංක 50 දරන අධිකාරී පනතේ අංක 52 වගන්තිය අනුව යම් වරදක් කිරීමට අදාලව අවස්ථාගත කරුණු සැලකිල්ලට ගෙන පාර්ශවකරුවන්ගේ කැමැත්ත අනුව ඒ වරද සම්බන්ධයෙන් නියම කළ හැකි උපරිම දඩයෙන් තුනෙන් එකක් නොඉක්මවන ප්‍රමාණයට සමථයකට පත්කල හැකිය. පනතට අනුව වරදක් සඳහා රු. 1,000,000 නොඉක්මවන දඩයකට යටත් වේ. මේ අනුව සමථයකදී අයකලහැකි උපරිම සමථ මුදල රු. 333,333 කි. අධිකාරිය දැනට සමථ මුදල් සඳහා භාවිතා කරන අංක 121–7 චක්‍රලේඛයේ වරදවල් දක්වා ඒ සඳහා රු.333,333 ක් වන උපරිම සමථ මුදලක් නියම කර ඇත.<br>යම් කොන්දෙසි කඩකිරීමක් සමථ කිරීමට පෙර අදාල පාර්ශවයන්ගේ ප්‍රායෝගික අපහසුතා අධිකාරිය සැලකිල්ලට ගත යුතුයි. මෙහිදි සමථ මුදල සඳහා අදාල අනෙක් පාර්ශවකරුවන් සභාපති හා අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරීයා වෙත අභියාචනා ඉදිරිපත් කරනු ලබයි. එහිදි අනෙකුත් අවස්ථානුකුල හා ප්‍රායෝගික තාක්ෂණික තත්වයන් නැවත සලකාබැලීමෙන් අනතුරුව අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරීයා ලෙස ලැබී ඇති අධිකාරි බලය මත සමථ මුදල් සංශෝධනය කරයි. | චක්‍රලේඛ ප්‍රකාරව සමථ මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරිය විසින් ලෝක වෙළඳ මධ්‍යස්ථානයෙන් කුලී පදනමට ලබාගත් වර්ග අඩි 6,995 ක භූමිය තුල වෙළඳ කුටි 35 ක් සකස් කර සුළු හා මධ්‍ය පරිමාණ වෙළඳුන් සඳහා කුලී පදනම මත ලබාදී තිබූ අතර සමාලෝචිත වර්ෂයේ රු.2,748,862 ක හා ඉකුත් වර්ෂයේ රු.3,232,365ක අලාභ ලබා තිබුණි. | ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ කඩ සාප්පු 41කින් වර්තමානය වන විට කඩසාප්පු 18 ක් පමණක් ක්‍රියාකාරී මට්ටමේ පවතින අතර මාසික කඩකුලී සහ විදුලි ගාස්තු නොගෙවීම මත කඩසාප්පු 02 ක් අධිකාරිය විසින් මුද්‍රා තබා ඇත. හිස්ව පවතින කඩසාප්පු වල කඩකුලී නොගෙවමින් නීති විරෝධීව දීර්සකාලීනව රැදී සිටින කුලීහිමියන් නිසා අධිකාරියට සිදු වී ඇති අලාභය අවම කිරීමේ අරමුණින් අධිකාරිය නීතිමය පියවර ගෙන ඇත. ශ්‍රී ලංකා මැණික් සහ ස්වර්ණාභරණ හුවමාරු මධ්‍යස්ථානයේ 05 වන මහල 2020 ජූලි මස 01 දින සිට හිමිකාර ආයතනයට භාරදීමට අධිකාරිය කටයුතු කර ඇත. | අලාභ ආවරණය කර ගැනීමට හා හිඟකුලී අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | අධිකාරියේ කාර්යභාරය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා කොළඹ කොටුව, පුරහල, කටුනායක, ගාල්ල හා මහනුවර යන ස්ථානවල රු.21,462,000 ක් වැය කර Digital පුවරු ඉදිකිරීම හා ඒවායේ වෙළඳ දැන්වීම් ප්‍රදර්ශනය කිරීම තුලින් මාසිකව රු.4,000,000 ක ආදායම් ඉපයීම අරමුණු කරගත් ව්‍යාපෘතියක් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. අනුමත ප්‍රදේශයක් නොවූ රත්නපුර නගරයේ රු.4,061,400 ක වියදමින් Digital පුවරුවක් ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරුවකුට භාරදී ඒ සඳහා අත්තිකාරම් සුරක්ෂණයක් රහිතව රු.800,000 ක අත්තිකාරමක්ද ගෙවා තිබුණි. අදාල ක්ෂේත්‍රයේ ප්‍රමාණවත් පළපුරුද්දක් නොතිබූ කොන්ත්‍රාත්කරු සවිකල පුවරුවේ අඩුපාඩු පවතින බවට අවස්ථා කිහිපයකදී තාක්ෂණික ඇගයීම් | "LED Digital" පුවරුව සවි කිරීම සඳහා ජාතික තරගකාරී ලංසු කැඳවීම යටතේ විනිවිදභාවයකින් යුක්තව පුවත්පත් දැන්වීමක් මගින් ලංසු කැඳවා ඇත. තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය සහ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතියට යටත්ව මෙම ප්‍රසම්පාදනය සිදු කොට ඇත. මෙම කොන්ත්‍රාත්කරු පසුගිය වර්ෂවල සිදුකරන ලද ව්‍යාපෘතිවල තොරතුරු එවා ඇත. කොන්ත්‍රාත්කරු විසින් කිසියම් වැඩ ප්‍රමාණයක් අවසන් කොට ඇති බව තහවුරුවූ පසු එම ඉදිකිරීමේ පිරිවැය සලකා බලා ගෙවීම සිදු කල බව හා මෙම ගෙවීම | ප්‍රසම්පාදන නීතිරීතිවලට අනුකූලව ව්‍යාපෘති විධිමත්ව ක්‍රියාත්මක කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කම්ටුව දැනුම් දී තිබුණත් ඒවා සකස් කර අධිකාරිය වෙත භාරදී නොතිබූ අතර ආදායම් ප්‍රවර්ධනය සඳහා අනුග්‍රාහක ආයතන සම්බන්ධ කරගෙනද නොතිබීම හේතුවෙන් ව්‍යාපෘතිය අසාර්ථක වී තිබුණි. | හිටපු සභාපතිතුමාගේ උපදෙස් සහ අනුමැතිය පරිදි සිදු කොට ඇති බව කාරුණිකව දන්වමි. තවද කොන්ත්‍රාත්කරු විසින් ඉදිරි මාස 2 ක ඇතුලත අධිකාරියට මෙම LED Digital පුවරුවෙහි සියලු වැඩ අවසන් කොට භාර දෙන බව ලිඛිතව දන්වා ඇත. | |
| (ඇ) | රත්නපුර දිස්ත්‍රික්කයේ පතල් වලවල් 5 ක් වැසීම සඳහා කොන්ත්‍රාත්කරුවන් සමඟ ගිවිසුම් ඇතිකරගෙන තිබුණද පතල් වලවල් 2 ක් වැසීමට කටයුතු කර නොතිබූ අතර කොන්ත්‍රාත්කරුවන් ගිවිසුම් ප්‍රකාරව තැබිය යුතු රු.3,601,935 ක මුල්‍ය සුරක්ෂණ ලබාගෙන නොතිබීම හේතුවෙන් ඊට අදාලව අලාභ අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | පතල් වලවල් 2 ක් අදාල කාලය තුල වසා දමා ඇත. ගනේගම, පාතකඩ, පිල්ලදෙනිය පතල් වල වැවක් තරමට විශාල වූවක් බැවින් එම පතල්වල වැසීම සඳහා අධික මුදලක් (ලක්ෂ 50ක් පමණ) දැරීමට සිදුවන බැවින් ද, දකුණු හුණුවල, නාරන්ගස්වත්ත පතල් වල වගා ලිදක් බැවින් ගම්වාසීන් එය වසා දැමීමට එරෙහිව කටයුතු කර ඇති බැවින්ද එම වලවල් වැසීම අධ්‍යක්ෂ(ඉඩම්/කැනීම්/පරිසර) විසින් නවතා ඇත. තවද, කාර්යසාධන සුරක්ෂිතය 2017 දෙසැම්බර් 31 දක්වා වලංගුව පැවති අතර අධිකාරියේ උපදෙස් පරිදි ඉතිරි වලවල් වසා නොදැමීම හේතු කොට ගෙන කාර්යසාධන සුරක්ෂිතය රාජසන්තක කිරීම හෝ වෙනයම් නෛතික පියවරක් ගැනීමට නොහැක. | ගිවිසුම් ප්‍රකාරව වලවල් වසා දමා පරිසර ආරක්ෂණය සඳහා පියවර ගත යුතුය. |

**3.3 අරමුදල් ඌන උපයෝජනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ස්වර්ණාභරණ සංවර්ධන අරමුදල භාවිතා කර කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට ස්වර්ණාභරණ නිෂ්පාදන මෙවලම් හා උපකරණ බෙදාදීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබුණි. ඒ යටතේ එක් ස්වර්ණාභරණ නිෂ්පාදන සංගමයකට පමණක් රු.4,115,184 ක උපකරණ බෙදාදී තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයේ අරමුදලේ පැවති රු.76,067,905 ක ශේෂය උපයෝජනයකින් තොරව රඳවා ගෙන තිබුණි. | පුබුදු ස්වර්ණාභරණ නිෂ්පාදකයින්ගේ සුභසාධක සංගමය පමණක් ඔවුන්ගේ යෝජනා හා වාර්තාවන් එවා තිබූ අතර අනෙකුත් සංගම් මේ සඳහා කිසිදු උනන්දුවක් දක්වා නොතිබුණි. නිෂ්පාදන ශිල්පීන් 80 දෙනෙකු මෙම සංගමයේ සාමාජිකත්වය ලබාගෙන ඇති බැවින්ද 2016 වර්ෂයේදී මධ්‍යම පලාත් කර්මාන්ත අමාත්‍යාංශය මගින් රිදී ස්වර්ණාභරණ නිෂ්පාදන කර්මාන්තය පත්වාගෙන යාමට පොදු සේවා මධ්‍යස්ථානයක් ඉදිකර තෙකලා විදුලිය සහ වෙනත් පහසුකම් ලබාදී තිබූ බැවින්ද, ගම්පල ප්‍රදේශයේ නිෂ්පාදකයින් සඳහා තාක්ෂණික දැනුම ලබාදීම අරමුණු කරගෙන මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලැබූ බව දන්වා සිටිමි.<br>මෙම අරමුදල මගින් මැණික් සහ ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු ආයතනය වෙත 2019 වර්ෂය තුල මැණික් සහ ස්වර්ණාභරණ ශිල්පීන් පුහුණු කිරීම සඳහා රු.780,597 ක් ද ස්වර්ණාභරණ මෝස්තර නිර්මාණකරණය, යාන්ත්‍රික සහ සම්ප්‍රදායක ස්වර්ණාභරණ නිෂ්පාදනය සඳහා ස්වර්ණාභරණ ශිල්පින් පුහුණු කිරීම වෙනුවෙන් උපදේශන සේවය සඳහා රු.45,000 ක් ද ගෙවීම් කර ඇත. | අරමුදල ඵලදායීව උපයෝජනයට අවශ්‍ය පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) 2017 හා 2018 වර්ෂවලදී අරමුදල භාවිත කරතිබූ රු.4,213,289 ක උපකරණ හා වත්කම් ස්වර්ණාභරණ සංගමයක් වෙත පරිත්‍යාග කර තිබුණද, ඒවා ඌන උපයෝජිතව පැවතීමෙන් උපකරණ ලබාදීමේ අරමුණු ඉටුවී නොතිබුණි. තවද, අරමුදල භාවිත කර සිදුකල පරිත්‍යාගවලින් කර්මාන්තය සඳහා වූ දායකත්වය අවම මට්ටමක පැවතුණි. | ස්වර්ණාභරණ කර්මාන්තයට තාක්ෂණික සහාය ලබාදීම වෙනුවෙන් සංගමය සඳහා ආභරණ නිෂ්පාදනයට අවශ්‍ය මූලික උපකරණ සහ ඒවාට අවශ්‍ය වෙනත් පහසුකම්ද ලබාදී ඇති අතර සංගමයේ සාමාජිකයන් එම පහසුකම් උපයෝගී කරගෙන ආභරණ නිෂ්පාදනය 2018 මැයි සිට ආරම්භ කර ඇත. | වත්කම් උපයෝජනය සම්බන්ධව පසු විපරම් කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අධිකාරිය විසින් ක්‍රියාත්මක කර තිබූ ජංගම රසායනාගාර සේවය තුල ස්වර්ණාභරණ ප්‍රමිතිය පරීක්ෂා කිරීමේ අරමුණින් 2016 මිලදී ගත් රු.7,794,888 ක් වටිනා රසායනාගාර උපකරණ 02 ක් වසර 3 කට අධික කාලයක් නිසි භාවිතයක් රහිතව තබා තිබූ අතර රු.183,548 ක් වූ මැණික් තොගයක් වසර 5 කට අධික කාලයක් තිස්සේ භාවිත නොකර නිෂ්කාර්යව තබා තිබුණි. | කොළඹ සහ ගාල්ල රන් ප්‍රමාණය නිශ්චය කිරීමේ කාර්යාංශ කේන්ද්‍ර කොටගෙන වැටලීම් කණ්ඩායම් යොදා ක්ෂේත්‍රයේදී ස්වර්ණාභරණ පරීක්ෂා කිරීමට Hand Held Type EDXRF යන්ත්‍ර 2 ක් මිලදී ගෙන තිබුණි. වැටලීම් අංශය සිදු කරන ස්වර්ණාභරණ වෙළෙඳසැල් පරීක්ෂා කිරීමේදී මෙම යන්ත්‍ර රැගෙන ගොස් ස්වර්ණාභරණවල ප්‍රමිතිය පරීක්ෂා කරනු ලබයි. තවද මෙම යන්ත්‍ර 2 ජංගම රසායනාගාරය මඟින් ස්වර්ණාභරණ පරීක්ෂා කිරීමේ කටයුතු සඳහා ද, ප්‍රධාන කාර්යාලයේ රසායනාගාරයේ ස්වර්ණාභරණ පරීක්ෂා කිරීම සඳහා ද, ස්වර්ණාභරණ ප්‍රදර්ශන හා දැනුවත් කිරීමේ වැඩමුළුවලදීද, අධිකරණ නියෝග මත ස්වර්ණාභරණ ක්ෂේත්‍ර පරීක්ෂා කිරීමේ හා බෞද්ධ කටයුතු අමාත්‍යාංශය මඟින් සංවිධානය කරනු ලබන ආගමික ස්ථානවල ස්වර්ණාභරණ තක්සේරු කිරීමේ කටයුතුවලදී ද දැනට භාවිතයට ගනු ලබයි. එබැවින් මෙම යන්ත්‍ර දෙක දැනටමත් පරීක්ෂා කිරීම් සඳහා භාවිතා කරනු ලබයි. | වත්කම් ඵලදායී ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | රත්නපුර ප්‍රාදේශීය කාර්යාලයේ පිහිටුවීමට යෝජිත කෞතුකාගාරයක් වෙනුවෙන් 2016 වර්ෂයේ මිලදීගත් රු.1,251,498 ක් වූ වත්කම් වර්ෂ 2 කට වැඩි කාලයක් තිස්සේ නිෂ්කාර්යව තබා තිබූ අතර විගණිත දින තෙක් කෞතුකාගාරය ආරම්භ කර නොතිබුණි. | සභාපති සහ ප්‍රධාන විධායක නිළධාරීතුමාගේ උපදෙස් පරිදි මෙහි ඉදිකිරීමේ කටයුතු ආරම්භ කලද කෞතුකාගාරය විවෘත කිරීමේ කටයුතු ප්‍රමාද විය. | -එම - |
| (ඇ) | අධිකාරිය සතු මාතර බෙලිදෙණිය ප්‍රදේශයේ පිහිටි වටිනාකම රු.889,000 ක් වූ පර්.චස් 80 ක ඉඩමක් හා එහි පිහිටි ලියාහල අගය රු.3,091,861 ක් වූ වර්ග අඩි 3,007 ක ගොඩනැගිල්ලක් 2012 වසරේ සිට වසර 7 කට වැඩි කාලයක් නිෂ්කාර්යව තබා තිබුණි. | මෙම ගොඩනැගිල්ල උපයෝජනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු කරමින් පවතී. | -එම - |

**3.5 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්**

**-----------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පරිගණක මෘදුකාංගයක් ස්ථාපිත කිරීම සඳහා රු.8,550,000 ක් 2018 වර්ෂයේ ගෙවා තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටද එම කාර්යය නිමකර නොතිබුණි. | පරිගණක මෘදුකාංගය ස්ථාපිත කිරීමේදී නිමකල 45% ක වැඩ සඳහා රු.8,550,000 ක් නිදහස් කර ඇත. පරිගණක පැකේජය ස්ථාපිත කිරීමට අදාල නිළධාරීන් පුහුණු කිරීම, කළමනාකාරීත්වය දැනුවත් කිරීම්, අවශ්‍ය පහසුකම් (VPN සම්බන්ධතා) හා උපකරණ මිලදී ගැනීම 2019 වර්ෂයේ සිදු කර ඇත. 2020 වර්ෂයේදී සම්පූර්ණයෙන් නිම කිරීමට අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී. | **ව්‍යාපෘති** සැලසුම් ප්‍රකාරව ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) | කළුගහ හැරනියාවක මැණික් ගැරීමේ ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 12.5 කට ව්‍යවසායකයෙකු 2017 අගෝස්තු 11 දින තෝරාගෙන තිබුණද එම ස්ථානයේ මැණික් ගැරීම සඳහා පරිසර නිර්දේශ සහ අනිකුත් රාජ්‍ය ආයතන වෙතින් ලබාගත යුතු අනුමැතීන් ලබා ගැනීමට අසමත් වීම හේතුවෙන් ව්‍යාපෘතිය විගණිත දින තෙක් ආරම්භ කර නොතිබුණි. | 1993 අංක 50 දරන ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරී පනතේ 14(ඊ)(උ) සහ 14(ඒ) වගන්තිවලට සහ පනතේ මූල්‍ය පරමාර්ථවලට අනුකූල වන ලෙසින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. කෙසේ වෙතත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ප්‍රථම අදාල නිර්දේශයන් ලබාගැනීමට අපේක්ෂා කෙරේ. | සැලසුම්ගත ව්‍යාපෘති ක්රියාත්මක කිරීමට කටයුතු කල යුතුය. |

**3.6 ප්‍රසම්පාදන කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම අනුව රු. මිලියන 518 ක් වැය කර ඉටුකල යුතු අධිකාරියේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල කඩා ඉවත් කර එම ස්ථානයේ මහල් 08 කින් යුතු නව කාර්යාලයක් ඉදිකිරීම, රත්නපුර ප්‍රදේශයේ ඉඩමක් මිලදී ගැනීම සහ කතරගම නිවාඩු නිකේතනයක් ඉදිකිරීම යන කාර්යයන් සිදුකර නොතිබුණි. | ප්‍රධාන කාර්යාල ගොඩනැඟිල්ල දැනට ඇති ස්ථානයේ මහල් 8 ක ගොඩනැඟිල්ලක් ඉදිකිරීමට මූලික සැලසුම් සකස් කලද, දැනට ඇති ස්ථානයේ මහල් 08 කට වැඩි ගොඩනැඟිල්ලක් සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලබා නොදීම මත මහල් 35 කින් යුත් ගොඩනැඟිල්ලක් ඉදිකිරීමට ගාලු මුවදොර ප්‍රදේශයේ පිහිටි රජයට අයත් ඉඩමක් අධිකාරිය වෙත පවරා ගැනීමට අවශ්‍ය කැබිනට් පත්‍රිකාව 2019 ජුලි 03 වන දින අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදි. අමප 19/1960/104/061/හා 2019 ජුලි 03 වන දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව 2020 ජනවාරි 08 දින කර්මාන්ත හා සැපයුම් කළමනාකරණ අමාත්‍යාංශයේ පැවති සාකච්ඡාවේදී ලබාදුන් උපදෙස් අනුව ඉදිරිපත් කරන ලද සංශෝධිත කැබිනට් පත්‍රිකාව සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී නොමැත. | ප්‍රසම්පාදන සැලසුම් ප්‍රකාරව අදාල කාර්යයන් ඉටු කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | රත්නපුර දෙමුවාවක මැණික් වීදිය ජාත්‍යන්තර මැණික් මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීම සහ මැණික් කුළුනක් ඉදිකිරීම සඳහා 2018 ජූලි 03 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණු අතර 2018 හා 2019 වර්ෂවල පිළිවෙලින් රු.මිලියන 100 ක් සහ රු.මිලියන 150 ක් වෙන්කර තිබුණද ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි. | 2018 ජූලි 03 දින අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව ව්‍යාපෘතිය ආරම්භ කිරීමට යෝජිත ඉඩම නිදහස් දීමනා පත්‍රයක් මගින් අධිකාරිය වෙත පවරා දීමට රත්නපුර ප්‍රාදේශීය ලේකම් එකගතාවය පලකර ඇති අතර, ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.<br>ව්‍යාපෘතිය සඳහා යෝජිත ඉඩමේ බිම් මැණුම් කටයුතු හා භූගත පසේ තත්වය පරීක්ෂා කිරීම සිදු කර ඇත. නාගරික සංවර්ධන අධිකාරියේ සහ එකඟතාවය ලබාගත යුතු රාජ්‍ය ආයතන වල මූලික අනුමැතිය ලබා ගෙන ඇත. ව්‍යාපෘතියට අදාල අවසන් සැලසුම් නාගරික සංවර්ධන අධිකාරිය වෙත 2020 මාර්තු මස ඉදිරිපත් කර ඇත. ව්‍යාපෘතියෙහි ප්‍රසම්පාදන කටයුතු සඳහා BOQ හා Tender Document උපදේශක ආයතනය අධිකාරිය වෙත ලබාදීමට නියමිතය. | ප්‍රසම්පාදන සැලසුම් ප්‍රකාරව අදාල කාර්යයන් ඉටු කිරීමට කටයුතු කල යුතුය. |

**3.7 මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් ධූරය සඳහා වසර 5 ක් තුල නිලධාරීන් 6 දෙනෙකු වැඩබැලීමට පත්කර තිබූ අතර ධූරය ස්ථිරව පිරවීමට තිබූ නෛතික බාධාව 2017 දෙසැම්බර් 13 දින සිට ඉවත්ව තිබුණද තනතුර පිරවීමට ක්‍රියාකර නොතිබුණි. 2011 වර්ෂයේ සිට පුරප්පාඩුව පවතින නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ධූරය පිරවීමට සමාලෝචිත වර්ෂයේද කටයුතු කර නොතිබුණි. | 1993 අංක 50 දරන අධිකාරි පනතේ 23 වන වගන්තිය යටතේ 2017 වසරේ සිට දිගින් දිගටම අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා පත් කරන ලද්දේ විෂයභාර අමාත්‍යතුමාගේ ලිඛිත නියෝග යටතේ වේ. එකී නියෝග අභිබවා යාමේ නොහැකියාව හේතුවෙන් එවැනි තත්වයක් ඇතිව තිබේ. | ඉහල කළමනාකරණ තනතුරු වහාම පිරවීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2009 වර්ෂයේ අනියම් ලිපිකරු තනතුරකට බඳවා ගෙන 2011 වර්ෂයේ කළමනාකරණ සහකාර කොන්ත්‍රාත් තනතුරකට පත්කර තිබූ සේවිකාවක 2013 අප්‍රේල් 05 සිට සංවර්ධන සහකාර ස්ථිර තනතුරකට පත්කර තිබුණි. අදාල සේවිකාව බඳවා ගැනීමේ පරිපාටි අනුව අදාල තනතුරු 3 සඳහාම අවශ්‍ය මූලික සුදුසුකම් සපුරා නොතිබූ අතර සංවර්ධන සහකාර ස්ථිර තනතුරට ප්‍රමාණවත් කාර්යභාරයක් පැවරීමටද කටයුතු කර නොතිබුණි. | 2009 අප්‍රේල් වන විට අදාල කරගනු ලැබූ පැරණි බඳවා ගැනීමේ පටිපාටිය යටතේ සේවිකාව සුදුසුකම් සපුරා තිබීම හේතුවෙන් අනියම් ලිපිකරු/ කළමනාකරණ සහකාර (කොන්ත්‍රාත්) තනතුර ලබාදී ඇත. පසුකාලීනව සංශෝධනය කරන ලද බඳවාගැනීමේ පටිපාටිය අනුව කළමනාකරණ සහකාර තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා නොතිබීම හේතුවෙන් එම තනතුරේ ස්ථිර කර නොතිබුණි. එවකට සිටි ජ්‍යෙෂ්ඨ කළමනාකාර (පිරිස් පාලන)ගේ නිර්දේශ හා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය යටතේ ක්‍රියාත්මක හා ප්‍රාදේශීය සංවර්ධන සහකාර (MA 5-1) තනතුර සඳහා පත් කර ඇත. අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කර ඇත. | සුදුසුකම් සහිත පුද්ගලයින් තනතුරු සඳහා බඳවා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | මැණික් කර්මාන්තය ආශ්‍රිතව සිදුවන අනීතික හා අනවසර ක්‍රියාවන් වැළැක්වීමට අධිකාරිය සිදුකරනු ලබන වැටලීම් සඳහා සුදුසු කාර්ය මණ්ඩලයක් පත්කර නොතිබුණි. | මැණික් කර්මාන්තයේ අනවසර ක්‍රියාවන් සම්බන්ධ නීති ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂවරයකු යටතේ ක්‍රියාත්මක හා ප්‍රාදේශීය සංවර්ධන අංශයක් ක්‍රියාත්මක වේ. | වැටලීම් සඳහා වෙනමම කාර්ය මණ්ඩලයක් පත් කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඈ) | 2019 ජූනි 22 දින සිට පුරප්පාඩු වූ අධ්‍යක්ෂ (රන් ප්‍රමාණය නිශ්චය කිරීම හා මුද්‍රා තැබීම) තනතුර සඳහා නිලධාරියෙකු බඳවා ගැනීමට කටයුතු නොකර කොන්ත්‍රාත් පදනම මත මාස 06 ක කාලයකට උපදේශකවරයෙකු බඳවා ගෙන තිබූ අතර අනුමැතියකින් තොරව ඉන්ධන දීමනා ලෙස සමාලෝචිත වර්ෂයේ රු.83,334 ක්ද ගෙවා තිබුණි. | 2019 ජූනි 22 දින සිට අධ්‍යක්ෂ (රන් ප්‍රමාණය නිශ්චය කිරීමේ) තනතුර හා 2019 නොවැම්බර් 10 දින සිට අධ්‍යක්ෂ (තක්සේරු/ රත්න විද්‍යාඥ) තනතුර පුරප්පාඩු වුවද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති එම බඳවා ගැනීමේ පරිපාටීන් සඳහා අනුමැතිය මෙතෙක් නොලැබීම හේතුවෙන් බඳවා ගැනීම් ප්‍රමාද වෙමින් පවතී. එබැවින් එම අංශ දෙකේම කාර්යභාරයන්, අඛණ්ඩව හා මෘදු පැවැත්මෙන් යුතුව පවත්වාගෙන යාමට මනා හැකියාවක් හා පළපුරුද්දක් සහිත නිලධාරියකු අධ්‍යක්ෂ මණ්ඩලීය අනුමැතිය | ස්ථිර නිලධාරියෙකු බඳවා ගැනීමට පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| | යටතේ කොන්ත්‍රාත් පදනමින් පත්කර අදාල ඉන්ධන දීමනාවද ගෙවන ලදී. කොන්ත්‍රාත් පදනම යටතේ හෝ නිලධාරියකු බඳවා ගැනීමෙන් අංශ දෙකක කාර්යයන් ගැටළු අවම වන පරිදි පවත්වාගෙන යාමේ හැකියාව ලැබී ඇත. | |

## 3.8 වාහන පද්ධති කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අධිකාරිය තුල වර්ෂ 10 කට වඩා වැඩි කාලයක් භාවිත කරන ලද පිරිවැය රු.9,378,888 ක් වූ වාහන 05 ක් සහ අගයක් සඳහන් නොවන තවත් වාහනයක් අපහරණය කිරීමට 2019 පෙබරවාරි 21 දින අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර තිබුණද එම වාහන අපහරණය කර නොතිබුණි. 2012 වර්ෂයේ රු.8,950,000 කට මිලදී ගත් වාහනයක් සඳහා වර්ෂ 7 ක් තුල රු.4,542,832 ක අලුත්වැඩියා හා නඩත්තු වියදම් දරා තිබූ අතර වාහනය භාවිතයට ගැනීමට හෝ අපහරණයට කටයුතු නොකර වර්ෂ 2 කට වැඩි කාලයක් තිස්සේ නිෂ්කාර්යව තබා තිබුණි. තවද, ආපදාවට ලක්වූ වාහනයක් අළුත්වැඩියා කර ධාවනයට එක් කිරීමට කටයුතු නොකර මාස 09 කට අධික කාලයක් නිශ්කාර්යව තබා තිබුණි. | අපහරණය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගැනීමෙන් අනතුරුව අපහරණ වාහන හඳුනාගැනීමට විශේෂ සමීක්ෂණ මණ්ඩලය සහ තක්සේරු මණ්ඩලය පත්කර එම වාර්තාද සමග අනුමැතිය ලබාගැනීම සඳහා 2019 ඔක්තෝබර් 25 දින මහවැලි සහ පරිසර අමාත්‍යාංශය වෙත යොමුකරන ලදී. නමුත් අදාල අනුමැතීන් ප්‍රමාද වීමත් රජය විසින් රාජ්‍ය ආයතන සඳහා නව වාහන මිලදී නොගැනීමට ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණයත් හේතුවෙන් මෙම වාහන අපහරණය නොකර අලුත්වැඩියාකර භාවිතා කිරීමට තීරණය කරන ලදී. | වාහන අපහරණය කිරීමට හෝ ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කල යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරියේ ප්‍රධාන අරමුණු වූ රන් ආනයනකරුවන් සඳහා පහසුකම් සැලසීම, ශ්‍රී ලංකා මැණික් හා ස්වර්ණාභරණ හුවමාරුව සඳහා පහසුකම් සැලසීම, රත්නදීප වෙළඳකුටිය මෙහෙයවීම හා කළමනාකරණය යන කාර්යයන් සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කිරීමට හා එකී අරමුණු ඉටු කිරීමට ක්‍රියාකර නොතිබුණි. | අධිකාරියේ පනතේ රන්කරුවන් සඳහා පහසුකම් සැපයීම සඳහා ප්‍රතිපාදන සළසා නොමැති අතර ස්වර්ණාභරණ කර්මාන්තය කරගෙන යන්නා වූ අයඳුම්කරුවන් අධිකාරියෙහි ලියාපදිංචි කරනු ලබයි. 2018 වර්ෂයේදී අප්‍රේල් මස සිට රන් ආනයනයේදී අයකරන 15%ක තීරුබදු ගාස්තුව සඳහා සහන සැලසීමට අධිකාරිය මැදහත් වී කැබිනට් පත්‍රිකාවක්ද සකස් කර අමාත්‍යංශය වෙත ඉදිරිපත් කර ඇත. ශ්‍රී ලංකා මැණික් සහ ස්වර්ණාභරණ හුවමාරුව සඳහා පහසුකම් සැපයීම හා ප්‍රවර්ධනය කිරීම ක්‍රියාකාරී සැළැස්මේ අංක 9.2 යටතේ දක්වා ඇති අතර අදාල මධ්‍යස්ථානය ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ සහ ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ සහරාවන්හි දැන්වීම් පළ කිරීම, විදේශ කටයුතු අමාත්‍යංශය සහ ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ පිහිටා ඇති ආයතන දැනුවත් කිරීම සිදු කරන ලදි. මධ්‍යස්ථානයේ පිහිටා ඇති සාප්පු හිමියන් සඳහා සියළු පහසුකම් සැපයීම අධිකාරිය මඟින් සිදු කරනු ලැබේ. | අරමුණු ක්රියාකාරී සැලැස්මට ඇතුලත් කර ඉටුකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | ක්‍රියාකාරී සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂය තුල ඉටුකල යුතුව තිබූ නව මැණික් තැන්පතු හඳුනා ගැනීමට අදාලව උපදේශන සේවා සැපයීම, පර්යේෂණ හා සංවර්.ධන ක්‍රියාකාරකම්, මැණික් කර්මාන්තය වැඩි දියුණු කිරීම හා මැණික් අපනයන ප්‍රවර්ධනය සඳහා දේශීය හා ජාත්‍යන්තර ප්‍රදර්ශන පැවැත්වීම, උසස් ප්‍රමිතියෙන් යුතු මැණික් හා ස්වර්ණාභරණ නිෂ්පාදනය සඳහා අගය එකතු කිරීමට අදාල පුහුණු | මැණික් පරීක්ෂා කිරීමේ රසායනාගාරයක් හා රන් ප්‍රමාණය නිශ්චය කිරීමේ රසායනාගාරයක් මහනුවර පිහිටුවීම කාලෝචිත නොවන බව සාමුහිකව තීරණය කර ඊට පිලියමක් ලෙස ප්‍රධාන කාර්යාලයේ පිහිටි රසායනාගාරවල තත්ත්වය ඉහල නැංවීමට තීරණය කරන ලදි. මැණික් පරීක්ෂා කිරීමේ රසායනාගාරය සඳහා ISO 17025:2017 ප්‍රමිති සහතිකය ලබා | ක්‍රියාකාරී සැලැස්ම ප්‍රායෝගික විය යුතු අතර එහි ඉලක්ක ළඟා කර ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පාඨමාලා පැවැත්වීම, ජාත්‍යන්තර ප්‍රමිතියට අනුව මැණික් පරීක්ෂා කිරීමේ සහ රන් ප්‍රමාණය නිශ්චය කිරීමේ නව රසායනාගාර 03 ක් ආරම්භ කිරීම, අධිකාරිය සපයනු ලබන සේවා ප්‍රමිතිකරණය කිරීම, නව ශාඛා කාර්යාල 02 ක් ඉදිකිරීම, සම්මන්ත්‍රණ ගොඩනැගිල්ලක් සහිත සංචාරක බලංගලාවක් ඉදිකිරීම යන කාර්යයන් සඳහා රු.397,450,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණත් එම කාර්යයන් වර්ෂය තුල ඉටුකර නොතිබුණි. | ගැනීමේ ක්‍රියාවලිය සිදු කරමින් පවතින අතර මූලික වැඩ කොටස දැනටමත් අවසන් වී ඇත. කොළඹ ප්‍රධාන කාර්යාලයේ රසායනාගාරය වැඩි දියුණු කිරීමට මිළ කැඳවීම සැපයුම් අංශය මඟින් සිදු කර ඇත. ප්‍රධාන කාර්යාලයේ පිහිටි මැණික් පරීක්ෂා කිරීමේ රසායනාගාරය උසස් කිරීම දැනටමත් සිදු කරමින් පවතී. ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇත. | |
| (ඇ) | මැණික් ඉඩම් 11 ක් වෙන්දේසි කිරීමෙන් රු.17,640,000 ක ආදායමක් ඉපයීමට ඉලක්ක කර තිබුණද එක් ඉඩමක් පමණක් වෙන්දේසි කර තිබූ අතර ඉන් රු.9,470,000 ක ආදායමක් උපයා තිබුණි. ජංගම සේවා තුලින් මැණික් ගැරීම් බලපත්‍ර නිකුත් කිරීම සහ අපනයන බලපත්‍ර ලබා දීම තුලින් රු.12,000,000 ක ආදායමක් ඉපයීම ඉලක්ක කර තිබුණත් එම බලපත්‍ර නිකුත් කර හෝ ආදායම් උපයා හෝ නොතිබූ අතර ගෙවුඩ කට්ට අපනයනයෙන් උපයා තිබූ ආදායම, ඉලක්ක කල රු.19,653,000 ක ආදායමෙන් සියයට 53 ක් පමණක් විය. | විශේෂ මැණික් ගැරීමේ ව්‍යාපෘති නැවැත්වීමෙන් පසුව වතු සමාගම් විසින් ඉඩම් වෙන්දේසි සඳහා ඉඩම් නිදහස් කිරීම ප්‍රතික්ෂේප කර ඇත. නිදහස් කර ගත හැකි ඉඩම් සංඛ්‍යාව අඩුවීමෙන් ආදායම ද අඩු වී ඇත. | -එම - |
| (ඇ) | දේශීය හා ජාත්‍යන්තර වශයෙන් මැණික් කර්මාන්තය වැඩිදියුණු කිරීම උදෙසා ජාත්‍යන්තර වෙළඳපල 11 ක් හා දේශීය වෙළඳපල 10 ක් පැවැත්වීමට රු.මිලියන 66 ක් වෙන්කර තිබුණද රු.මිලියන 9.4 ක් වැයකර පවත්වා තිබුණේ ජාත්‍යන්තර හා දේශීය වෙළඳපලවල් 12 ක් පමණි. | ජාත්‍යන්තර වෙළෙඳ ප්‍රදර්ශන සඳහා ප්‍රමාණවත් අයදුම් කරුවන් පිරිසක් නොසිටීම, අපනයනකරුවන් සෘජුව වෙළෙඳ කුටි වෙන්කර ගැනීම හා ප්‍රදර්ශන සඳහා සහභාගීවීමට අපනයනකරුවන් කැමැත්තක් නොදැක්වීම නිසා සැළසුම් කරන ලද ජාත්‍යන්තර ප්‍රදර්ශන ක්‍රියාත්මක කළ නොහැකි විණි.<br>ලෝක වෙළෙඳ මධ්‍යස්ථානයේ ශ්‍රී ලංකා මැණික් සහ ස්වර්ණාභරණ හුවමාරු මධ්‍යස්ථානය ප්‍රචලිත කිරීමටත්, නැව් මඟින් පැමිණෙන විදේශීය සංචාරකයින් ශ්‍රී ලංකාවේ මැණික් සහ ස්වර්ණාභරණ කෙරෙහි ආකර්ෂණය කරගැනීමත් අරමුණු | -එම - |

| | | |
|---|---|---|
| | කොට ගෙන සැළසුම් කරන ලද වෙළෙඳ ප්‍රදර්ශනය අදාල ආයතනවල සහයෝගීතාවය ලබා ගත නොහැකි වීම මත ව්‍යර්ථ විණි . පැවති අස්ථාවර දේශපාලනික පසුබිම, වරින් වර වෙනස් වූ අධිකාරියේ සභාපතිධූරය හේතුවෙන් සැළසුම් කරන ලද ප්‍රදර්ශන සංවිධානය කළ නොහැකි විය. 2019 අප්‍රේල් සිදුවූ පාස්කු ප්‍රහාරය සමඟ වෙළෙඳ පොළ ප්‍රවර්ධනය කිරීම අරමුණු කොටගත් වැඩසටහන් සංවිධානය නොකරන ලදී. | |
| (ඉ) සමාජ ආරක්ෂණ කටයුතු යටතේ පතල් කැණීම් හේතුවෙන් හානියට පත් ප්‍රදේශ 4 ක් යථාවත් කිරීමට රු.මිලියන 15 ක් වෙන්කර තිබුණද රු.281,656 ක් වැයකර එක් ස්ථානයක් පමණක් ප්‍රතිසංස්කරණය කර තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | - එම - |

**4.2 තිරසාර සංවර්ධන අරමුණු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසාර සංවර්ධනය පිළිබඳව එක්සත් ජාතීන්ගේ වසර 2030 ''න්‍යාය පත්‍රය'' ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කල යුතුව පවතින අතර අධිකාරිය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් දැනුවත් වී තිබුණද ඊට අදාල කිසිඳු කාර්යයක් සමාලෝචිත වර්ෂය තුල ඉටුකර නොතිබුණි. | තිරසර සංවර්ධනයට අදාල එක්සත් ජාතීන්ගේ න්‍යාය පත්‍රයට අදාල කටයුතු කඩිනමින් ඉටු කරනු ලබන බව දන්වා සිටිමි. | විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුයි. |